FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2021 මැයි

කලාප අංක 05


මාධ්‍යවේදී නිමලරාජන් ඝාතනය කිරීම පිළිබඳ නඩුවේ විත්තිකරුවන් 6 දෙනා නීතිපති උපදෙස් මත නිදහස් කිරීම


පරිපාලන නිලධාරියකු වූ චමිල ඉන්දික ජයසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම


ප්‍රකට සන්නිවේදකයකු වූ වෛද්‍ය චමල් සංජීවට එරෙහිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විනය පරීක්ෂණයක් ආරම්භ කිරීම

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්/පසු විපරම් සම්බන්ධ කෙටි වාර්තාකරණයක් සහ ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍ය නිදහසට බලපාන ලෙස සිදුවන ප්‍රතිපත්තිමය වෙනස්කම්, මාධ්‍යවේදීන්ගේ නිදහස හා අයිතීන් සම්බන්ධයෙන් මෙන්ම ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම් කෙරෙහිද මෙහිදී අවධානය යොමු කර ඇත. සමාජ වගකීමක් සහිතව කටයුතු කරන බ්ලොග්කරුවන්, පුරවැසි මාධ්‍යවේදීන්, සමාජ මාධ්‍ය පරිශීලකයන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, සමාජ යහපත වෙනුවෙන් කටයුතු කරන මානව හිමිකම් ක්‍රියාකාරිකයන්, අකටයුතු නාදකයන් ඇතුළු සිවිල් පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය සහ පුරවැසියන්ට සාමකාමීව රැස්වීමට, සංචරණයට හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති අනුලංඝනීය අයිතිය මෙන්ම ඒ සියලු දෙනාට ඇති තොරතුරු දැනගැනීමට ඇති අයිතිය ද ඒ අතරින් විශේෂය.**

මෙවර වාර්තාවට ඇතුළත් වන සිදුවීම් 9න් කිහිපයක් ම පුරවැසි සමාජයට අදාළව අදහස් ප්‍රකාශ කිරීමේ අයිතීන් උල්ලංඝනය වූ අවස්ථා වෙයි. 2021 මැයි මස තුළ නිරීක්ෂණයට ලක්වූ එම සිදුවීම් 9, මාධ්‍ය නිදහස හා අයිතීන් පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/සංරචකයන්ට අදාළ ලෙස ගොනු කර ඇත. සිදුවීම් දෙකකට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් ප්‍රවෘත්ති නිවේදන නිකුත් කරන ලදි. මීට අමතරව ඊශ්‍රායලය විසින් ගාසා තීරයේ මාධ්‍ය ආයතන පිහිටි ගොඩනැගිලිවලට ප්‍රහාර එල්ල කිරීම හෙළා දකිමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව නිවේදනයක් නිකුත් කළේය.

## මැයි මාසය තුළ වාර්තා වූ නව සිදුවීම්

1. ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය නිමිත්තෙන් යුනෙස්කෝ සංවිධානය විසින්, 1991 මැයි 03 වැනිදා ප්‍රකාශයට පත් කරන ලද වින්ඩ්හෝක් ප්‍රකාශනය, 'වින්ඩ්හෝක් 30+ ප්‍රකාශනය' ලෙස යාවත්කාලීන කිරීම.
2. 2000 වසරේදී මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනය කිරීම පිළිබඳ නඩුවේ විත්තිකරුවන් 6 දෙනා නීතිපති උපදෙස් මත නිදහස් කිරීම.

3. දෙමළ භාෂා ගුරුවරයකු හා කවියකු වන අහ්නාෆ් ජසීම් ත්‍රස්ත විමර්ශන අංශය මගින් අත්අඩංගුවට ගෙන වසරක් සම්පූර්ණ වීම නිමිත්තෙන් අන්තර්ජාලය ඔස්සේ සංවාද දෙකක් පැවැත්වීම හා ඔහු නිදහස් කරන ලෙස ජාත්‍යන්තර සංවිධාන සමූහයක් රජයට බල කිරීම.

4. මාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනය පියවර ගන්නා බවට අනතුරු ඇඟවීමේ ලිපියක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීම.

5. කොවිඩ් 19 ව්‍යාප්තිය පිළිබඳව පුවත්පතක පළ කළ ලිපියක් හා යූටියුබ් නාලිකාවක් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවක් හේතුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකට සන්නිවේදකයකු වූ වෛද්‍ය චමල් සංජීවට එරෙහිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විනය පරීක්ෂණයක් ආරම්භ කිරීම.

6. සිය ෆේස්බුක් ගිණුම ඔස්සේ වන විනාශය සම්බන්ධයෙන් සිදු කළ පළ කිරීමක් සහ ඔහු විසින් බෙදා හරින ලද පළ කිරීම් (පෝස්ට්) දෙකක් හේතුවෙන් පරිපාලන නිලධාරියකු වූ චමිල ඉන්දික ජයසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම.

7. මුල්ලිවයික්කාල් සමරුව පැවැත්වීමට එරෙහි වාරණ නියෝගයක් මඩකලපුවේ මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සෂිකරන් වෙත භාර දීමට පොලිසිය උත්සාහ දැරීම.

8. පොලිස් නිලධාරීන් ලෙස හඳුන්වාගත් පිරිසක් උදයන් පුවත්පතේ මාධ්‍යවේදී රාමචන්ද්‍රන් සනත්ගේ තොරතුරු රැස් කිරීම.

9. මුලතිව්හි මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ගේ වෘත්තීය කටයුතුවලට ප්‍රවේශවීම වැළැක්වීමට යුද හමුදාවේ නිලධාරීන් කටයුතු කිරීම.

**වගු අංකඃ 01 වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 මැයි**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| 02 | නීතිමය කොන්දේසි | 03 |
| 03 | මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රවණතා | 01 |
| | **එකතුව** | **09** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ අත්‍යවශ්‍ය සාධකයකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. මෙම මූලික නිදහසට අභියෝග එල්ල වූ අවස්ථා පහක් මැයි මාසය තුළ නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ වෘත්තීය කටයුතුවලට බාධා කිරීම මෙන්ම පොදුවේ අදහස් පළ කිරීම අධෛර්යමත් කරන ප්‍රවණතාවක් එම සිදුවීම්වලින් නිරීක්ෂණය වේ.**

**වගු අංකඃ 02 - 2021 මැයිඃ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රකාශනයේ නිදහස අහිමි කිරීම | 02 |
| 02 | සංචරණයේ සහ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිය | 01 |
| 03 | මානසික බලපෑම් | 02 |
| | **එකතුව** | **05** |

## මාසය තුළ නව සිදුවීම්:

1. **මාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනය පියවර ගන්නා බවට අනතුරු ඇඟවීමේ ලිපියක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීම.**

ජනමාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කිරීම යන ශීර්ෂය යටතේ 2020-05-10 දතමින් යුත් ලිපියක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් වෙත යවා තිබේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් "විවිධ කණ්ඩායම් වශයෙන් හා පුද්ගලිකව නිවරදි නොවන තොරතුරු මත පදනම් වූ සෞඛ්‍ය තොරතුරු හා දත්ත ඉදිරිපත් කරමින්ද සෞඛ්‍ය ප්‍රතිපත්ති විවේචනය කරමින්ද ජනමාධ්‍ය ඔස්සේ විවිධ ප්‍රකාශ සිදු කිරීමේ ප්‍රවණතාවක් දක්නට ඇති බව" එම ලිපියෙහි සඳහන් කරන ලේකම්වරයා, ආයතන සංග්‍රහයේ වගන්ති කිහිපයක් උපුටා දක්වමින්, එම විධිවිධාන නොතකා ක්‍රියා කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා බව දැනුම් දී තිබේ.

රජයේ නිලධරයන් ජනමාධ්‍ය ඔස්සේ ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධයෙන් විධිවිධාන පවතින ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVII වන පරිච්ඡේදයේ 6 සහ 7 වගන්ති සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති හෝ පරිපාලන ක්‍රියාමාර්ග හෝ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම හා විවේචනය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන පවතින ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ XXXI වන පරිච්ඡේදයේ 3වන වගන්තියද එම වගන්තිය සංශෝධනය කරන 2019.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2019 ද එම ලිපිය මගින් අවධාරණය කොට ඇත.

මෙම ලිපිය, සමස්ත සෞඛ්‍ය සේවකයන්ගේ අදහස් පළ කිරීමේ නිදහසටද සංවිධානය වීමේ නිදහස, වෘත්තීය සමිති අයිතිවාසිකම් යනාදියටද දැඩි බලපෑමක් ඇති කරන අතර අනෙක් අතට තොරතුරු දැනගැනීමේ නිදහසටද, ජනමාධ්‍ය නිදහසටද දැඩි තර්ජනයක් එල්ල කරන බව නිරීක්ෂණය කළ හැකිය.

එමෙන්ම එම ලිපියේ නීත්‍යානුකූලභාවය පිළිබඳවද ගැටලු මතු වේ. මූලික අයිතිවාසිකමක් වන අදහස් පළ කිරීමේ නිදහස, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට වඩා ඉහළින් පවතින බව 76/2012 දරන මූලික අයිතිවාසිකම් නඩු තීන්දුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින්ද තහවුරු කර ඇත. (මූලාශ්‍රය: පී.එස්. මනෝහාරි පැල්කැටිය එදිරිව එච්.එම්. ගුණසේකර සහ වෙනත් අය - නඩු අංකය 76/2012)

එමෙන්ම 2016දී තොරතුරු අයිතිය මූලික අයිතියක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කෙරුණු අතර 2016 අංක 12 දරන තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධාන ඊට පෙර බලපැවැත්වූ නීතිවලට ඉහළින් බලපැවැත්වෙයි.(මූලාශ්‍රය:අදාළ පනත)

සෞඛ්‍ය ලේකම්වරයාගේ මෙම පියවර, වසංගත තත්ත්වය පිළිබඳ තොරතුරු වසං කිරීමේ උත්සාහයක් බවත්, නිලධාරීන්ගේ අදහස් පළ කිරීමේ අයිතිය මෙන්ම විවිධ මූලාශ්‍රවලින් තොරතුරු ලබාගැනීමට ජනමාධ්‍යවලට ඇති අයිතිද උල්ලඝනය කිරීමක් බවත් අවධාරණය කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මේ පිළිබඳ මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. (මූලාශ්‍රය: එම නිවේදනය)

2. **කොවිඩ් 19 ව්‍යාප්තිය පිළිබඳව පුවත්පතක පළ කළ ලිපියක් හා යූටියුබ් නාලිකාවක් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවක් හේතුවෙන් සෞඛ්‍ය විෂය පිළිබඳ ප්‍රකට සන්නිවේදකයකු වූ වෛද්‍ය චමල් සංජීවට එරෙහිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විනය පරීක්ෂණයක් ආරම්භ කිරීම.**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වතු හා නාගරික කටයුතු නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය චමල් සංජීව කලක පටන් සෞඛ්‍යමය කාරණා පිළිබඳව ජනමාධ්‍යවලට ලිපි ලියන හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගී වන ප්‍රකට සන්නිවේදකයෙකි. ජනමාධ්‍යවලට ප්‍රකාශ ලබා දීම සම්බන්ධයෙන් මැයි 31 වැනිදා මූලික විමර්ශනය සඳහා කටඋත්තරයක් ගැනීමට පැමිණෙන ලෙස, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා (පාලන) විසින් ඔහුට දැනුම් දී තිබිණි. එහෙත් ඔහුට එරෙහි චෝදනා මොනවාදැයි දැනුම් දී නැත. වෛද්‍ය සංජීව එදින පරීක්ෂණයට සහභාගී වීමට නොහැකි බව දැනුම් දීමෙන් පසු නැවත ජූනි 7 වැනිදා පැමිණෙන ලෙස දන්වා ඇත.

මාධ්‍ය වාර්තා සඳහන් කරන ආකාරයට රට ලොක්ඩවුන් නොකළහොත් ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව මැයි 16 වැනිදා දිවයින පුවත්පතේ පළ කළ ලිපියක් හා ඉන් පසුව යූ ටියුබ් නාලිකාවක් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක් මෙම පරීක්ෂණය හේතු වී තිබේ. සෞඛ්‍ය ලේකම්වරයා විසින් 2020-05-10 දතමින් නිකුත් කර ඇති ලිපිය ක්‍රියාවට නැංවීමක් ලෙසද මෙය නිරීක්ෂණය කළ හැකිය. (මූලාශ්‍ර: 1. දිවයින පුවත්පතේ පළ වූ ලිපිය https://bit.ly/2TdVbIV 2. යූ ටියුබ් නාලිකාව සමඟ සාකච්ඡාව)

ප්‍රකාශන අයිතිය සීමා කිරීම හා බියගැන්වීම හිසින් 2021-05-22 වැනිදා නිවේදනයක් නිකුත් කරන 'වැඩ කරන ජන බලය' සංවිධානය, මෙම විනය පරීක්ෂණය ඇතුළු තවත් ක්‍රියාමාර්ගවලට විරෝධය පළ කළේය.

3. **පොලිස් නිලධාරීන් ලෙස හඳුන්වාගත් පිරිසක් විසින් උදයන් පුවත්පතේ මාධ්‍යවේදී රාමචන්ද්‍රන් සනත්ගේ තොරතුරු රැස් කිරීම.**

පොලිස් නිලධාරීන් බව ප්‍රකාශ කරන පුද්ගලයන් හා කණ්ඩායම් අවස්ථා කිහිපයකදී තමා පිළිබඳ තොරතුරු

විමසමින් පවුලේ අය හා ඥාතීන් හමු වී ඇති බවට මාධ්‍යවේදී රාමචන්ද්‍රන් සනත් පොලිස්පතිවරයා වෙත ලිඛිත පැමිණිල්ලක් යොමු කර ඇත. උදයන් පුවත්පතේ මාධ්‍යවේදියකු ලෙස කටයුතු කරන ඔහු 'සුඩර් ඔලි' සඟරාවේ හිටපු සම කර්තෘවරයකු මෙන්ම සමාජ ක්‍රියාකාරිකයකුද වේ.

අදාළ ලිපියෙන් ඔහු ප්‍රකාශ කරන ආකාරයට 2021 මාර්තු මාසයේදී ගම්පොළ පිහිටි සිය මවගේ නිවසට ගම්පොළ පොලිසියේ නිලධාරීන් ලෙස හඳුන්වාදෙමින් පැමිණි පිරිසක් ඔහුගේ රැකියාව, රැකියා ස්ථානය, ගම්පොළ අතහැර වෙනත් ප්‍රදේශයක පදිංචියට යෑමට හේතුව යනාදී තොරතුරු විමසා ඇති අතර පසුව තලවකැලේ පොලිස් කොට්ඨාසයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස හඳුන්වාදුන් පිරිසක් තලවකැලේ පිහිටි ඔහුගේ බිරිඳගේ නිවසට පැමිණ, එහි සිටි ඔහුගෙන් ප්‍රශ්න කර ඇත. ඔහු සම්බන්ධ වී කටයුතු කරන 'කඳුකර යුක්තියේ හඬ' සංවිධානයේ කටයුතු පිළිබඳව මෙම අවස්ථාවේ ඔහුගෙන් විමසා ඇත. ඉන් පසුව මැයි 25 වැනිදා ගම්පොළ පිහිටි ඔහුගේ සහෝදරියගේ නිවසට ද පොලිස් නිලධාරියකු ලෙස පෙනී සිටි අයකු පැමිණ තොරතුරු විමසා ඇත.

මේ පිළිබඳව මැයි 27 වැනිදා පොලිස්පතිවරයා වෙත ලිපියක් යොමු කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, මාධ්‍යවේදී රාමචන්ද්‍රන් සනත් පිළිබඳව තොරතුරු රැස් කරන්නේ පොලිසිය විසින්ද, එසේ නම් ඒ කවර හේතුවක් මත දැයි පරීක්ෂණයක් කොට සත්‍ය හෙළිදරව් කරන ලෙස ඉල්ලා සිටියේය.

මෙවැනි ක්‍රියා මාධ්‍යවේදීන් මෙන්ම ඔවුන්ට සම්බන්ධ පවුල්වල අයද මානසික පීඩාවට ලක් කරන සිදුවීම් ලෙස නිරීක්ෂණය කළ හැකිය.

4. **මුලතිව්හි මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ගේ වෘත්තීය කටයුතුවලට ප්‍රවේශ වීම වැළැක්වීමට යුද හමුදාවේ නිලධාරීන් කටයුතු කිරීම.**

මුලතිව් ප්‍රදේශය පදනම් කරගෙන මාධ්‍යකරණයේ නිරත මාධ්‍යවේදියකු වන ෂන්මුගම් තවසීලන් මැයි 22 වැනිදා මුලතිව් නගරයේ රාජකාරි කටයුත්තක් සඳහා යමින් සිටියදී, වට්රාපලෙයි තුන්වන සැතපුම් කණුව අසල මුරපොළේ හමුදා නිලධාරීන් විසින් ඔහු නගරයට පිවිසීම වළක්වා ඇත. එම නිලධාරීන් පවසා ඇත්තේ ඉහළ නිලධාරීන් නියෝග කර ඇති බැවින්, ඔහුට මුරපොළෙන් ඔබ්බට යෑමට ඉඩ දිය නොහැකි බවයි. ඒ අවස්ථාවේදී මාධ්‍යවේදියා මුල්ලියාවලෙයි පොලිස් ස්ථානාධිපතිවරයා අමතා ඒ පිළිබඳව දැනුවත් කර ඇති අතර එම නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ ඔහුට යෑමට බාධාවක් නැති බවයි. එහෙත් හමුදා නිලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ පොලිසිය කිව්වත් යන්න දිය නොහැකි බවය. පසුව පොලිස් ස්ථානාධිපතිවරයා අදාළ මුරපොළ භාර ඉහළ හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව මාධ්‍යවේදියාගේ තොරතුරු සටහන් කරගෙන ඔහුට යෑමට ඉඩ දී ඇත. (මූලාශ්‍රය: ලීඩර් වෙබ් අඩවියේ වාර්තාව සහ අදාළ සිදුවීමේ වීඩියෝ පටය https://bit.ly/3bVpVEO)

මෙම සිදුවීම සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කාරිනිය විමසීමක් කර ඇති අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාද ප්‍රකාශ කර ඇත්තේ මාධ්‍යවේදීන්ගේ රාජකාරි කටයුතු වෙනුවෙන් ඔවුන්ට සංචරණ සීමා බල නොපාන බවයි. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පනවා ඇති සංචරණ සීමා මාධ්‍යවේදීන්ගේ රාජකාරි සඳහා අදාළ නොවන බව බලධාරීන් ප්‍රකාශ කළ ද අදාළ රාජකාරි කරන නිලධාරීන් නිවැරදිව දැනුවත් නොවන බැවින් හෝ පනවා ඇති නියෝගවලට පිටින් ක්‍රියාකාරන බැවින් හෝ මාධ්‍යවේදීන්ට බාධා සිදු වීම නොවිය යුතු දෙයකි. මෙම මුරපොළෙන් ඔහුට පෙර තවත් මාධ්‍යවේදීන්ද නතර කර තිබූ බව මාධ්‍යවේදී තවසීලන් ප්‍රකාශ කරයි.

5. **මුල්ලිවයික්කාල් සමරුව පැවැත්වීමට එරෙහි වාරණ නියෝගයක් මඩකලපුවේ මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සෂිකරන් වෙත භාර දීමට පොලිසිය උත්සාහ දැරීම.**

ශ්‍රී ලංකා හමුදාව හා එල්ටීටීඊ සංවිධානය අතර අවසන් සටනේදී මියගිය අය සිහිකිරීම සඳහා මැයි 18 වැනිදා 'මුල්ලිවයික්කාල් සැමරුම' ලෙස ප්‍රකට සමරු වැඩසටහන නොපවත්වන ලෙස උසාවියෙන් ලබාගත් වාරණ නියෝගයක් මඩකලපුවේ මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සෂිකරන් වෙත භාර දීමට පොලිසිය පැමිණ ඇතත් මාධ්‍යවේදියා එය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබේ. (මූලාශ්‍රය: JDS වෙබ් අඩවියේ වාර්තාව https://bit.ly/3uOBKDr) සෂිකරන් මෑතක් වන තුරු සිරස ආයතනයේ ශක්ති රූපවාහිනියේ වාර්තාකරුවකු ලෙස කටයුතු කළ අතර දැනට නිදහස් මාධ්‍යවේදියකු ලෙස කටයුතු කරයි. සෂිකරන් පවසන්නේ අදාළ වාරණ නියෝග යේ තමන් ධීවර සංගම් සභාපතිවරයකු ලෙස සඳහන් කර තිබූ නමුත් තමන් එවැනි කිසිදු තනතුරක් නොදරන බවයි. පොලිසිය ඉහත සැමරුමට එරෙහි මෙවැනි වාරණ නියෝග 21ක් විවිධ පුද්ගලයන්ට එරෙහිව ලබාගෙන ඇති අතර මඩකලපුවේ තවත් මාධ්‍යවේදියකුද ඒ අතර සිටින බව ඔහු ප්‍රකාශ කළේය.

පසුගිය පෙබරවාරි මාසයේදී පැවති විරෝධතා ව්‍යාපාරයකට එරෙහිවද මෙබඳු තහනම් නියෝගයක් සෂිකරන් වෙත ලබා දී තිබුණු අතර, තමන්ට දිගින් දිගටම සිදු කරන පීඩාවට එරෙහිව මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි කරන බවද සෂිකරන් ප්‍රකාශ කරයි.

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 3ක් මැයි මාසය තුළ නිරීක්ෂණය විය. එම සිදුවීම්වලින් එකක් අදහස් පළ කිරීමේ නිදහසට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමක් වන අතර, තවත් සිදුවීමක් ජනමාධ්‍යවේදීන් සම්බන්ධ සිදුවීම්වලදී දණ්ඩමුක්තිය යන උපශීර්ෂයට අයත් වේ. තෙවැනි සිදුවීම මින් පෙර වාර්තා වූ සිදුවීමකට අදළ වර්ධනීය අවස්ථාවකි.**

**වගු අංකඃ 03 - 2021 මැයිඃ නීතිමය කොන්දේසි- සිදුවීම් 03**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 02 |
| 02 | ජනමාධ්‍යවේදීන් සම්බන්ධ සිදුවීම්වලදී දණ්ඩමුක්තිය | 01 |
| | **එකතුව** | **03** |

## මාසය තුළ නව සිදුවීම්ඃ

1. **2000 වසරේදී මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනය කිරීම පිළිබඳ නඩුවේ විත්තිකරුවන් 6 දෙනා නීතිපති උපදෙස් මත නිදහස් කිරීම.**

   යාපනය අර්ධද්වීපය පදනම් කරගෙන මාධ්‍යකරණයේ නිරත මාධ්‍යවේදියකු වූ මයිල්වාගනම් නිමලරාජන් 2000 වසරේ ඔක්තෝබර් 19 වැනිදා ඝාතනයට ලක් කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා සිටි විත්තිකරුවන් 6 දෙනෙකු නිදහස් කිරීමට මැයි 5 වැනිදා යාපනය මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. ඒ අදාළ නඩුව අවසන් කරන ලෙස නීතිපතිවරයා විසින් දෙන ලද උපදෙස්වලට අනුවය. (මූලාශ්‍රයඃ ටයිම්ස් වෙබ් අඩවිය https://bit.ly/3bfRati ) නීතිපතිවරයාගේ උපදෙස් නොමැති වීම හේතුවෙන් මෙම නඩුව 2004 අගෝස්තු මාසයේ සිට දීර්ඝ කාලයක් විභාගයට ගැනීමෙන් තොරව බහා තබා තිබිණි.

   මයිල්වාගනම් නිමලරාජන්, දුෂ්කර තත්ත්වයන් යටතේ වාර්තාකරණය පිළිබඳව ලාංකීය සංකේතයක් සේ පිළිගැනෙන මාධ්‍යවේදියෙකි. ඔහු ඝාතනයට ලක් වීමෙන් පසුව ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ඔහුට '2000 වසරේ දුෂ්කර තත්ත්වයන් යටතේ වාර්තාකරණය' පිළිබඳ සම්මානය පිරිනැමිණි. ඝාතනය වන අවස්ථාව වන විට ඔහු බීබීසී ලෝක සේවයේ සංදේශය හා තමිල් ඕසෙයි, රාවය, වීරකේසරී පුවත්පත් හා ගුවන්විදුලි සහ රූපවාහිනී සේවා රැසකට නිදහස් මාධ්‍යවේදියකු ලෙස සේවය කළ අතර 'හරය' ටැබ්ලොයිඩ් සිංහල පුවත්පතේ යාපනය නිල වාර්තාකරු විය.

   නිමලරාජන් ඝාතනය සම්බන්ධයෙන් ඝාතනයෙන් සිව් වසරක් ඇතුළත සැකකරුවන් 11 දෙනෙකු අත්අඩංගුවට ගැනුණු අතර පරීක්ෂණවලදී හෙළි වූ පරිදි ඒ සියලුම දෙනා ඊපීඩීපී සංවිධානයේ සාමාජිකයන්ය. ඉන් සැකකරුවන් 5 දෙනෙකු පසුව නිදහස් කෙරුණු අතර ඉතිරි සැකකරුවන් 6 දෙනාට වරින් වර ඇප ලබා දී තිබිණි. නිමලරාජන් ඝාතනය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුළු දේශීය මාධ්‍ය සංවිධාන මෙන්ම ජනමාධ්‍ය නිදහස හා මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන විසින්ද ඉකුත් විසි වසර පුරාම වරින්වර පැවති රජයන්ට බලපෑම් කළ නමුත් එම අරමුණ ඉටු කර ගැනීමට නොහැකි විය.

   නීතිපතිවරයාගේ තීරණයට විරෝධය පළ කරමින් නිවේදනයක් නිකුත් කරන ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, නිමලරාජන් ඝාතනය පිළිබඳව යළිත් පරීක්ෂණයක් ආරම්භ කොට අපරාධකරුවන්ට දඬුවම් ලබා දිය යුතු බව අවධාරණය කරයි. (මූලාශ්‍රයඃ කලම්බුපෝස්ට් වෙබ් අඩවිය https://bit.ly/3fq7AC5)

2. **ෆේස්බුක් ඔස්සේ සිදු කළ පළ කිරීම් හේතුවෙන් පරිපාලන නිලධාරියකු වූ චමිල ඉන්දික ජයසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම.**

   වන විනාශය පිළිබඳ සාවද්‍ය තොරතුරු සිය ෆේස්බුක් ගිණුමේ පළ කළේය යන චෝදනාව මත, කොත්මලේ සහකාර ඉඩම් නිරවුල් කිරීමේ කොමසාරිස් චමිල් ඉන්දික ජයසිංහ මැයි 21 වැනිදා කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනිණි.

   "රට තුළ වන විනාශයක් සිදුවෙමින් පවතින බව පවසමින් මෙම නිලධාරියා සිය ෆෙස්බුක් පිටුවේ අසත්‍ය ප්‍රවෘත්ති කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇති" බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක ඒකකය විසින් සිදු කළ පරීක්ෂණයේදී හෙළි වූ කරුණු අනුව සැකකරු අත්අඩංගුවට ගත් බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නි. පොලිස්පති අජිත් රෝහණ ප්‍රකාශ කළේය. (මූලාශ්‍රයඃ Newswire වෙබ් අඩවිය https://bit.ly/3vbvLcF )

   මැයි 22 වැනිදා, දණ්ඩ නීති සංග්‍රහයේ 120 යටතේ

'රජයට එරෙහිව ජනතාව කුපිත කිරීම' යන චෝනාව මත සැකකරු කොළඹ අංක 7 මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කෙරුණු අතර ඔහුගේ ෆේස්බුක් ගිණුමේ වන විනාශය සම්බන්ධයෙන් කළ පැරණි පළ කිරීමක් සහ ඔහු විසින් බෙදා හැර තිබූ තවත් පළ කිරීම් දෙකක් පිළිබඳව පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කර තිබේ.

චමිල් ජයසිංහ පොලිස් විමර්ශකයන්ට පිහියකින් ඇනීමට තැත් කරමින් විමර්ශකයන්ට තර්ජනය කළ බවට පොලිසිය අසත්‍ය කරුණු අධිකරණයේ ප්‍රකාශ කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාරගත කිරීමට ඉල්ලුම් කළ නමුත් එම කරුණු දැක්වීම් පිළි නොගත් අධිකරණය සැකකරු රැ. ලක්ෂයක ශරීර ඇප මත මුදාහැරීමට නොයෝග කළ බව නීතිඥ මංජු ශ්‍රී චන්ද්‍රසේන ප්‍රකාශ කරයි. (මූලාශ්‍රය: අයිතිය වෙබ් අඩවිය)

චමිල් ජයසිංහ අත්අඩංගුවට ගැනීමේ සිදුවීම සමාජ මාධ්‍ය ඔස්සේ දැඩි ආන්දෝලනයක් ඇති කළ අතර ඔහු දේශපාලන බලපෑම්වලට යටත් නොවී සෘජු ලෙස රාජකාරි කරන, නීති විරෝධී වන විනාශයන්ට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කළ නිලධාරියකු බවට බොහෝ දෙනා අදහස් පළ කර තිබේ.

මෙම අත්අඩංගුවට ගැනීම හෙළා දකිමින් නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එය අදහස් පළ කිරීමෙන් හා විවේචනයෙන් වැළකිය යුතු බවට රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන අඳුරු බියගැන්වීමේ සංඥාවක් බවත් රාජ්‍ය සේවකයන්ටද පුරවැසියන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමි සෑම අයිතිවාසිකමක්ම අනුල්ලංඝනීයව භුක්ති විඳීමේ නිදහස තිබිය යුතු බවත් අවධාරණය කළේය. (මූලාශ්‍රය: එම නිවේදනය)

වැඩ කරන ජන බලය සංවිධානයද නිවේදනයක් නිකුත් කරමින් මෙම අත්අඩංගුවට ගැනීමට විරෝධය පළ කර ඇත.

3. **දෙමළ භාෂා ගුරුවරයකු හා කවියකු වන අහ්නාෆ් ජසීම් ත්‍රස්තවාදී විමර්ශන අංශය මගින් අත්අඩංගුවට ගෙන වසරක් සම්පූර්ණ වීම නිමිත්තෙන් අන්තර්ජාලය ඔස්සේ සංවාද දෙකක් පැවැත්වීම හා ඔහු නිදහස් කරන ලෙස ජාත්‍යන්තර සංවිධාන සමූහයක් රජයට බල කිරීම.**

අන්තවාදී අදහස් ප්‍රවර්ධනය කරන කවි පොතක් ප්‍රකාශයට පත් කළේය යන චෝදනාව මත දෙමළ භාෂා ගුරුවරයකු හා කවියකු වන අහ්නාෆ් ජසීම් අත්අඩංගුවට ගෙන, මැයි 16 වැනිදට වසරක් සම්පූර්ණ විය. ආරක්ෂක ඇමතිවරයාගේ රැඳවුම් නියෝග මත කොළඹ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ රඳවාගෙන සිටින අහ්නාෆ්ට එරෙහිව මෙතෙක් අධිකරණය ඉදිරියේ චෝදනා ගොනු කිරීමට පොලිසිය අපොහොසත්ව තිබේ. අහ්නාෆ් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට එරෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් අප්‍රේල් 10 වැනිද ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කෙරුණු අතර එය ඉදිරියේදී සලකා බැලීමට නියමිතය.

අහ්නාෆ් කවියා නිදහස් කර ගැනීම පිළිබඳව කලා සංස්කෘතික හා මාධ්‍ය සමාජය තුළ උද්‍යෝගිමත් කතිකාවතක් ආරම්භ වී ඇති අතර මැයි 16 වැනිද ඒ පිළිබඳව ඉතා සාර්ථක සාකච්ඡා දෙකක් අන්තර්ජාලය ඔස්සේ පැවැත්විණි. මෙම සංවාද සංවිධානය කර තිබුණේ ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංවිධානය සහ නම් නොකළ සිවිල් හා දේශපාලන ක්‍රියාකාරිකයින්ගේ එකතුවක් විසිනි.

අයුක්තිසහගත ලෙස රඳවාගෙන සිටින අහ්නාෆ් කවියා නිදහස් කරන ලෙස රජයට බල කරමින් මානව හිමිකම්, ප්‍රකාශන අයිතිය හා නිර්මාණකරණයේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින ජාත්‍යන්තර සංවිධාන 13ක් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කළේය. මෙවැනි මානව හිමිකම් උල්ලංඝනයන්ට මග පාදන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙසද එම සංවිධාන සමූහය රජයට බල කර සිටී. (මූලාශ්‍රය: https://bit.ly/34pgutj)

අහ්නාෆ් කවියා නිදහස් කරන ලෙස බල කරමින් කලාවේ හා ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීමේ ක්‍රියාකාරී කමිටුව විසින් අන්තර්ජාල පෙත්සමක් දියත් කළේය. (මූලාශ්‍රය: Petition • Secretary, Ministry of Defence of Sri Lanka: අහ්නාෆ් ජසීම් කවියා ආරක්ෂා කරනු! • Change.org)

**වගු අංකය: 04 - 2021 මැයි: මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රවණතා - සිදුවීම් 01**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රවණතා | 01 |

1. **ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය නිමිත්තෙන් යුනෙස්කෝ සංවිධානය විසින්, 1991 මැයි 03 වැනිද ප්‍රකාශයට පත් කරන ලද වින්ඩ්හෝක් ප්‍රකාශනය, වින්ඩ්හෝක් 30+ ප්‍රකාශනය ලෙස යාවත්කාලීන කිරීම.**

යුනෙස්කෝ සංවිධානය විසින් 1991 මැයි 03 දින ප්‍රකාශයට පත් කරන ලද වින්ඩ්හෝක් ප්‍රකාශනය, මෙවර ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය නිමිත්තෙන් යාවත්කාලීන කරන ලදි. නව ප්‍රකාශනය වින්ඩ්හෝක් 30+ නමින් හැඳින්වෙයි. එම ප්‍රකාශනය විසින් 1991 වින්ඩ්හෝක් ප්‍රකාශනයේ පණිවුඩය වත්මන් සමාජ ආර්ථික දේශපාලන සන්දර්භයට ගැළපෙන පරිදි ඉදිරියට ගෙන එන්නේ යැයි පිළිගැනේ.

කොවිඩ්-19 දැඩි වසංගත තත්ත්වය විසින් මාධ්‍ය සන්දර්භය තුළ පිහිටි සාම්ප්‍රදායික මාධ්‍ය ව්‍යාපාර ආකෘතීන් කඩාකප්පල් කිරීම මධ්‍යයේ, මාධ්‍ය වැඩීමේ අවදානම වැනි මාධ්‍ය නිදහසට අඛණ්ඩව මුහුණ දීමට සිදු වන නව අභියෝගයන් මෙම ප්‍රකාශනය මගින් අවධාරණය කරයි. "දුස්තොරතුරු සහ වෛරී ප්‍රකාශන ව්‍යාප්තිය සහ ප්‍රවර්ධනය කිරීමද අභියෝගයට ලක් කිරීමද, ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ නව තර්ජන සහ පුවත්පත් කලාවේ අදීනත්වය, කාන්තා මාධ්‍යවේදිනියන්ට මාර්ගගත සහ අන්තර්ජාලය ඔස්සේ කරනු හිරිහැර කිරීම වළක්වාලීමද" අද දවසේ ප්‍රමුඛ කාර්යයන් ලෙස වින්ඩ්හෝක් 30+ අවධාරණය කරයි.

අන්තර්ජාලය ඔස්සේ පැවති මෙම සම්මන්ත්‍රණයට රටවල් 150ක, නියෝජිතයින් 3000කට ආසන්න පිරිසක් සහභාගි වී යැයි වාර්තා විය.

නිදහස්, ස්වාධීන හා බහුත්ව මාධ්‍යවේදයක් සංවර්ධනය කිරීම සඳහා වූ වින්ඩ්හෝක් ප්‍රකාශය යනු අප්‍රිකානු පුවත්පත් මාධ්‍යවේදීන් විසින් 1991දී, නැමීබියාවේ අගනුවර වන වින්ඩ්හෝක් හි 1991 අප්‍රියෙල් 29 සිට මැයි 3 දක්වා යුනෙස්කෝව විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ මාලාවක් අවසානයේ එළි දක්වන ලද ප්‍රකාශනයයි. නිදහස් මාධ්‍ය පිළිබඳ පුළුල් බලපෑමක් කළ ප්‍රථම ජාත්‍යන්තර ප්‍රකාශනය ලෙස වින්ඩ්හෝක් ප්‍රකාශනය සැලකේ.

**වගු අංකː 05 - මාධ්‍ය නිදහසː 2021 ජනවාරි-මැයි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම් සංඛ්‍යාව**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - අප්‍රේල් | 2021 මැයි |
|---|---|---|
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 14 | 05 |
| නීතිමය කොන්දේසි | 22 | 03 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 01 | |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | | 01 |
| එකතුව | **36** | **09** |

පසුගිය වාර්තා

**පසුසටහනː** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

Free Media Movement
Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25